*සැ. යු.* - 2024.12.27 වැනි දින පළ කරන ලද අංක 2417 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,418 - 2025 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2025.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | 02 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් | |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 - B 082642 — 177 (2025/01)
C 1 -

# පිස්කල් විකිණීම්

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බ්‍රේසියා ග්‍රාමින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 88/2, හලාවත පාර, කට්ටුව, මීගමුව.

*..........පැමිණිලිකරු.*

නඩු අංකය : 3851/MB
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
ඇස්කීසි අංකය : 09/2024

*එදිරිව*

නානෝබ් ආරච්චිගේ ක්‍රිස්ටි මාකස්,
අංක 03, ශාන්ත අන්තෝනි මාවත,
නැ-කටාන, කටාන.

*.............විත්තිකරු.*

වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 30 වැනි දින දරන සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගම වෙත අයකර ගන්නට කියා නියම කොට තීන්දු ප්‍රකාශය කරන ලද රුපියල් ලක්ෂ තිහක (රු. 30,00,000/-) මුදලින් රුපියල් විසිහතර ලක්ෂ විසිදහසක (රු. 24,20,000/-) මුදලක් මේ දක්වා ඉහත නම් සඳහන් විත්තිකරු විසින් ගෙවා නොමැති බැවින් මෙම නඩුවේ ඇස්කීසි ක්‍රියාවේ යෙදවීමේ බලපත්‍රයක් නිකුත් කර අධිකරණයෙන් නැවත වැඩිදුරටත් ආඥාවක් ලැබෙන තෙක් මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ යම් ලෙසකින් පැවරීම අන්සතු කිරීම හෝ වැය බරකට යටත් කිරීම ඒ සම්බන්ධයෙන් යම් ලේඛන ඉදිරිපත් කිරීම හෝ ලියාපදිංචි කිරීම හෝ උපදෙස් දීම එකී විත්තිකරු හට තහනම් කර එයින් වළක්වන ලද හෙයින් සහ එයින් හෝ ඉන් කොටසක් මුදලට හෝ ත්‍යාග වශයෙන් අන් ක්‍රමයකට ලබාගැනීම සියල්ලන්ටම තහනම් කරන ලද හෙයින්,

**වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 23 වැනි දින ප. ව. 2.30 ට,**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේදී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද, එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75% ඉතිරි මුදල දින 30 ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, අලුත්කුරු කෝරලයේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කටාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නැගෙනහිර කටාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නැගෙනහිර කටාන පිහිටි තේකගේ අගාර මරදගහමුල්ල නමැති ඉඩමට එස්. එම්. දිසානායක බලයලත් මිනින්දෝරු තැන මැන සාදන ලද අංක 1408 සහ 2000-11-18 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ ඉඩම් කොටසට මායිම්: උතුරට : පාර ද, නැගෙනහිරට : ජේ. ඒ. දේවිකා ශිරෝමනීගේ ඉඩම ද, දකුණට : රුවන් ප්‍රිය වසන්තගේ ඉඩම ද, බස්නාහිරට : රවී ජයවර්ධනගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනක් (පර්. 13) විශාල කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ, පස, පළතුරු ආදී සියලු දේත් සමග වේ. (මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක H168/109 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.)

එම්. එම්. කේ. ශ්‍රියාන්ත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය/මීගමුව.

වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 02 වැනි දින දී ය.

01-04

**සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 01, යෝර්ක් වීදිය, අංක 76 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යනු ලබන.

කොළඹ 02, යුනියන් පෙදෙස, අංක 242 දරන ස්ථානයේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පබ්ලික් ලිමිටඩ් කම්පැණි.

නඩු අංක : CHC (Civil) 184/2008/MR
ඇස්කිසි අංක : 04/2017

*............පැමිණිලිකරු.*

*එදිරිව*

1. සමර්විල් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ්,
   අංක 137, චොක්සෝල් වීදිය, කොළඹ 02.

2. සිලෝන් හෝල්ඩිංස් ලිමිටඩ්,
   අංක 137, චොක්සෝල් වීදිය, කොළඹ 02.

3. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී,
   අංක 450, ගාලු පාර, කොළඹ 03.

*............විත්තිකරුවන්.*

වර්ෂ 2012 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව අනුව රුපියල් තිස් හතර මිලියන හත් ලක්ෂ පනස් නව දහස් හැටයි ශත හතලිස් පහක (රු. 34,759,060.45) ක මුදලක් සහ 2008.04.28 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තෙක් රුපියල් 24,000,000/- ක මුදලක් මත 22% ක වාර්ෂික පොළියක් මත පොළියක් ද රුපියල් 10,072,336/-ක මුදලක් මත 10%ක වාර්ෂික පොළියක් මත පොළියක් ද, පැමිණිලිකරුට ගෙවන ලෙසට 1 වන සහ 2 වන විත්තිකරුවන්ට නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති බැවින් ද, එකී මුදල සහ පොළිය අයකර ගැනීම උදෙසා පැමිණිල්ලේ උපලේඛනයේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ඉඩම් සහ පරිශ්‍රය ද, එයට අයත් මාර්ග ප්‍රවේශ සහ විත්තිකරුවන්ට අයත් සියලුම හිමිකම් සම්බන්ධයෙන් ද, හා කවර අන්දමක වූ ඉල්ලීම් ද, සහිතව හා සියලු ලැබීම හා 1 වන සහ 2 වන විත්තිකරුවන්ට හිමි සියලුම අයිතිවාසිකම් ද, 1 වන සහ 2 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයවිය යුතු මුදල අයකර ගැනීම උදෙසා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 2707 දරන 2001.07.26 දිනැති උකස්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. සූරියආරච්චි විසින් ලියා සහතික කළ අංක 831 දරන 2006.09.26 දිනැති උකස්කරයන් මත බැඳී ඇති බවට හා ඇස්කිසි කළ හැකි බවට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති බැවින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ දේපළ විශේෂයෙන් බැඳී ඇති බවට ද, ඇස්කිසි ගත හැකි බවට ද, ගරු අධිකරණය නියෝග කර ඇති හෙයින් මා විසින් තහනමට ගන්නා ලද 02 වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025ක් වූ ජනවාරි මස 31 වැනි දින පෙරවරු 11.00 ට,**

2 වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත් කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාලයේ කොට්ඨාස අංක 01, හැඳල යන ගමේ පිහිටි බලගල පාරේ වරිපනම් අංක 175 දරන ඩේවොත් ඩේයි බලගලවත්ත යන ඉඩමට බලයලත් මානක බී. එච්. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 2001/05/04 දිනැති සහ අංක "2007" දරන පිඹුරේ ලොට් අංක "A1" යන ඉඩමට මායිම්,

උතුරට : පී. ජී. බිබිලියාන, එම්. ඩී. බෙනඩික්ට්, ජේ. ඒ. ඩී. ඇල්බට්, කේ. දියනේරිස් පී. මරියා මුදල්හාමි, එච්. සේවාසියන්සෝ, එච්. සිරිසෝම යන අයට අයත් ඉඩම සහ විල්බට් බී. රොඩ්‍රිගු මානකවරයාගේ අංක 420 දරන මූලික පිඹුරේ ලොට් අංක 40 දරන ඉඩම ද,

නැගෙනහිරට : කිව්. මේරි බියට්රිස්, නීල් ඇන්තනී, ඩබ්ලිව්. එෆ්. ජෝසෆ්, එච්. ඒ. ඩබ්ලිව්. පෙරේරා යන අයට අයත් ඉඩම් අංක 4731 දරන පිඹුරේ ලොට් අංක 02 දරන ඉඩම සහ මෙහි ලොට් අංක B දරන ඉඩම ද,

දකුණට : බලයලත් මානක එච්. ඒ. පීරිස්ගේ අංක 4731 දරන පිඹුරේ ලොට් අංක 02 දරන ඉඩම, මෙහි ලොට් අංක A3 සහ A2 දරන ඉඩම ද,

බටහිරට : ජී. සෝමා චිත්‍රිනි සිල්වා සහ ජී. පද්මිනි සිල්වා යන අයට අයත් ඉඩම් ද,

යන මායිම් තුළ පිහිටි අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම තුනක (අක්. 01, රූඩ්. 02, පර්. 2.3) ක් විශාලත්වයෙන් යුත් ඉඩමේ බිම ගහකොළ පළතුරු ආදි සියල්ල සමඟ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 860/230 යන වෙලුම/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම්වල මාර්ග අයිතිය ද සමඟ වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත් කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාලයේ කොට්ඨාස අංක 01, හැඳල යන ගමේ පිහිටි බලගල පාරේ ඩේවොන් ඩේරි බලගලවත්ත යන ඉඩමට බලයලත් මානක බී. එච්. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 2001/05/04 දිනැති සහ අංක 2007 දරන පිඹුරේ ලොට් අංක "A3" යන ඉඩමට මායිම්,

උතුරට : ලොට් අංක A 1 ද, නැගෙනහිරට : මෙහි ලොට් අංක A 1 සහ බලයලත් මානක එච්. ඒ. පීරිස්ගේ අංක 4731 දරන පිඹුරේ ලොට් අංක 02 දරන ඉඩම් ද,

දකුණට : අඩි 30ක පාරක් සඳහා වෙන් කරන ලද ඉඩමට කොටස (මාගේ 1968 දරන පිඹුරේ ලොට් අංක B) සහ බී. එම්. කුසුමාවතිට අයත් බලගල පාරේ, වරිපනම් අංක 136/7A දරන ඉඩම් ද, බටහිරට : මෙහි ලොට් අංක A 2 ඉඩම් ද,

යන මායිම් තුළ පිහිටි එකී අංක 2007 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම එකයි නවයක් (රූ. 01 පර්. 0.19) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි එකයි හතක (හෙ. 0.1017) විශාලත්වයෙන් යුත් ඉඩමේ බිම ගහකොළ, පළතුරු ආදි සියල්ල සමඟ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 860/231 යන වෙලුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් අංක A 1 සහ A 2 දරන ඉඩම් කොටස් පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කළ ඉඩම් කොටස් වේ.

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාලයේ කොට්ඨාස අංක 01 හැඳල යන ගමේ පිහිටි බලගල පාරේ, වරිපනම් අංක 175 දරන ඩෙවොන් ඩේරි බලගලවත්ත යන ඉඩමට බලයලත් මානක එච්. අනිල් පීරිස් විසින් මැන සාදන ලද 2000/01/22 දිනැති සහ අංක 2007 දරන පිඹුරේ ලොට් "1" යන ඉඩමට මායිම්,

උතුරට : පී. සී. බිබිලියාන, එම්. ඩී. බෙනඩික්ට්, ජේ. ඒ. ඩී. ඇල්බට්, කේ. ලියනෝරිස්, පී. මරියා මුදල්හාමි. එස්. සේවසික්ස්ඤෝ, එච්. සිරිසෝම යන අයට අයත් ඉඩම් විල්බට් බී. රොඩ්‍රිගු මානකවරයාගේ අංක 420 මූලික පිඹුරේ ලොට් අංක 40 හි කොටසක් සහ ලොට් 2 ද,

නැගෙනහිරට : සී. මේරි බියට්රිස්, එල්. ඩී. නීල් ඇන්තනි, ඩබ්ලිව්. එෆ්. ජෝසෆ්, එච්. ඒ. ඩබ්ලිව්. පෙරේරා යන අයට අයත් ඉඩම් සහ ලොට් අංක 02 සහ 03 දරන ඉඩම් ද,

දකුණට : ලොට් අංක 02 සහ 03 දරන ඉඩම සහ බී. එම්. කුසුමාවතීට අයත් බලගල පාරේ, වරිපනම් අංක 136/7A දරන ඉඩම් සහ ඇන් පිලිප්ගේ ඉඩම ද,

බටහිරට : බී. එම්. කුසුමාවතීට අයත් බලගල පාරේ, වරිපනම් අංක 130/7A දරන ඉඩම ද, ඇන්. පිලිප්ගේ ජී. සෝමා චිත්‍රිනි සිල්වා සහ ජී. පද්මිනී සිල්වා, පී. පී. බිබිලියානු, එම්. ඩී. බෙනඩික්ට් යන අයට අයත් ඉඩම් සහ ලොට් අංක 02 ද,

යන මායිම් තුළ පිහිටි එකී අංක 4731 දරන පිඹුරට අනුව අක්කර දෙකයි, රූඩ් තුනයි, පර්චස් දහනවයයි දශම නවයයි හයක (අක්. 2, රූඩ් 3, පර්. 19.96) හෝ හෙක්ටයාර් 1.16337 විශාලත්වයෙන් යුත් ඉඩමේ බිම, ගහකොළ, පළතුරු ආදී සියල්ල සමඟ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 860/204 යන වෙලුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

(2) හැඳල යන ගමේ ඬෙවොත් ඬේරි බලගලවත්ත යන ඉඩමට බලයලත් මානක ජී. ඩබ්ලිව්. ෆර්නැඩෝස් විසින් මැන සාදන ලද 1957/11/23 දිනැති සහ අංක 514/1957 දරන පිඹුරේ ලොට් අංක 2 දරන (අඩි 30ක පාරක් සඳහා වෙන් කරන ලද) ඉඩමට මායිම්.

උතුරට : එම ඉඩමේම කොටසක් සහ ලොට් අංක 02 ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ද,

දකුණට : එම ඉඩමේම කොටසක් සහ ගම් සභා පාර ද, බටහිරට : එම ඉඩමේම කොටසක් ද,

යන මායිම් තුළ පිහිටි එකී අංක 514/1957 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් විසිහයක (රූඩ් 1 පර්. 26) විශාලත්වයෙන් යුත් ඉඩමේ බිම, ගහකොළ පළතුරු ආදී සියල්ල සමඟ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ B 860/73 යන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

(3) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාලයේ කොට්ඨාස අංක 01, හැඳල යන ගමේ පිහිටි බලගල පාරේ, ඬෙවොත් ඬේරි බලගලවත්ත යන ඉඩමට බලයලත් මානක අනිල් පීරිස් විසින් මැන සාදන ලද 2000/01/22 දිනැති සහ අංක 4731 දරන පිඹුරේ (මීටර් 9ක් පළල පාරක් සඳහා වෙන් කිරීමක් වන) ලොට් අංක 3 දරන ඉඩමට මායිම්,

උතුරට : ලොට් අංක 01 සහ 02 ද, නැගෙනහිරට : ලොට් අංක 02 සහ නැසීගිය එම්. ඩී. මේරිහාමිගේ උරුමක්කරුවන්ට අයත් වරිපනම් අංක 15/1, බලගල පටුමගේ අංක 01 ඉඩම ද,

දකුණට : ලොට් අංක 02 සහ නැසීගිය එම්. ඩී. මේරිහාමිගේ උරුමක්කරුවන්ට අයත් වරිපනම් අංක 15/1, බලගල පටුමග අංක 01 ඉඩම ද, සහ බලගල පාරේ සිට ඇති පාර සහ බී. එම්. කුසුමාවතීගේ බලගල පාරේ වරිපනම් අංක 136/7A දරන ඉඩම ද, බටහිරට : ලොට් අංක 01 ද,

යන මායිම් තුළ පිහිටි එකී අංක 4731 දරන පිඹුරට අනුව පර්චස් දොළහයි දශම බිංදුවයි හතරක (පර්. 12.04) විශාලත්වයෙන් යුත් ඉඩමේ බිම ගහකොල, පළතුරු ආදී සියල්ල සමඟ වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 860/206 යන වෙලුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය/පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින දී ය.

01-07

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2025.01.03 | සිකුරාදා | 2024.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.10 | සිකුරාදා | 2024.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.17 | සිකුරාදා | 2025.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.24 | සිකුරාදා | 2025.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.31 | සිකුරාදා | 2025.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2025.02.07 | සිකුරාදා | 2025.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.14 | සිකුරාදා | 2025.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.21 | සිකුරාදා | 2025.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.28 | සිකුරාදා | 2025.02.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2025.01.07 | සිකුරාදා | 2025.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.14 | සිකුරාදා | 2025.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.21 | සිකුරාදා | 2025.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.28 | සිකුරාදා | 2025.01.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.